# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2014 - නව නිර්දේශය**

**2018 අගෝස්තු/සැප්තැම්බර්/ඔක්තෝබර්**

**මානවශාස්ත්‍ර පීඨය**

**සිංහල**

**පුරාතන සිංහල සාහිත්‍යය හා භාෂා ප්‍රවේශය SINH E - 1025**

**පළමුවන කොටසත්, දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න <u>දෙක</u> බැගිනුත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03.00 යි.

---

අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩුකරනු ලැබේ.

### <u>I කොටස</u>

01. (අ) පහත සඳහන් ඡේදය වත්මන් ලිහිල් බසින් ලියා අවස්ථා සම්බන්ධය පැහැදිලි කර දක්වන්න.

"ජාම්බෝනද ස්වර්ණයට බඳු ව දිව් දළින් ඔප් නැගූ රන් රුවනට බඳු උතුම් රූ දරන්නා වූ කාන්තාව, මේ ලෝකයෙහි සත්ත්වයන්ට ප්‍රියකරු වූ යම් වස්තුවක් ඇත්නම් ඒ සියල්ල ම මාගේ බොහෝ කොට ඇත්තේ ය. මා හා සමග මගේ භවනයට අවුත් ලෝකාස්වාදරතියෙන් යෙදී වාසය කරව. ඉදින් මා කීවාට නොමැලිව නොආයේහි වී නම් දැන් ම බලාත්කාරයෙන් මාගේ විමානයට ගෙන ගොසින් තී හා සමග වාසය කෙරෙමි. එසේ ගෙන ගිය කල්හිත් මා සිත් ගෙන වාසය නොකෙළෙහි නම් එවිට ම තී මට ගොදුරු වන්නේ ය" යි කීයේ ය. මෙසේ කියා ජව සතකින් යුක්ත රූක්ෂ ප්‍රකෘති ඇති පිටතට නික්මුණු මහත් දළ ඇති පාත්‍රුවට සේ මහත් ව රත් ව පිටතට නෙරීසිටියා ඇස් ඇති දානව රාක්ෂස තෙම ඒ වන මාධ්‍යයෙහි කිසි පිහිටක් නැති ව අසරණ ව සිටි ඒ රජ දුව අත අල්වා ගත්තේ ය.

ලකුණු 12 (8+4)

(ආ) පහත සඳහන් පද්‍යයන්හි අර්ථය වත්මන් ලිහිල් බසින් ලියා කවියා සතු වර්ණනා චාතුර්යය සැකෙවින් අගයන්න.

පු ලා සුවඳ මල ' වුල් කර වරල් බැ ඳ
දු ලා රන් පතින් සරසා සවන් සො ඳ
නි ලා දිගු නුවන් රසඳුන් තනා ඇ ඳ
බ ලා සිටු රඟන රඟ මඬල කල්බ ඳ

වි දෙ න ලෙළෙන නරුබර පුළුලුකුළ රැ ඳි
හෙළ න න ග න අත නුවනග බැලුම් දි ඳි
රු වි න දි ලෙ න අබරණ කැලුම ගත යෙ ඳි
සැලෙන ප හ න සිළු වැනි රඟන ලිය සැ ඳි

| | | |
|---|---|---|
| ලකළ | පුළුලුකුළ බඳ මිණි මෙවු | ල්ලා |
| සමග | රන් සළඹ රැව් දී වෙවු | ල්ලා |
| වයන | පදට තබමින් පද කම | ල්ලා |
| රඟන | ළඳුන් බල රූසිරි සිය | ල්ලා |

| | | |
|---|---|---|
| ව ස් | දඬු බිඟු කොවුල් වීණා නද මියු | රූ |
| ර ස් | වූ සෙයින් සත්සර රස ගී සොඳු | රූ |
| අ ස් | වන ලියන් දැක ලිය කිඳුරඟන යු | රූ |
| තොස් | කර තසිත සවනත නුවනත මිතු | රූ |

**ලකුණු** 12 (8+4)

## II කොටස

02. ජීවිතය හා ජීවන ගැටලු පිළිබඳ ගුඪ චෛතසික විවරණයෙහි ලා **ජාතකකථාකරුවා** දැක් වූ සුවිශේෂ සාමර්ථ්‍යය සනිදර්ශනව පරීක්‍ෂා කරන්න.

03. වස්තු වෛචිත්‍ර්‍යයෙහි ලා **සැළලිහිණි කවියා** සතු වූ විශිෂ්ට ප්‍රතිභාව පැහැදිලි කරන්න.

නැතහොත්

"**සැළලිහිණි සන්දේශයෙන්** ප්‍රකට වන කාව්‍ය පරිනතතාව සිරි රහල් හිමියන්ගේ පරිණත කවිත්වයට මනා නිදසුනකි." උදාහරණ දක්වමින් විමසන්න.

04. **කුරුණෑගල යුගයේ** සිංහල ගද්‍ය සාහිත්‍යය පිළිබඳ සමාලෝචනයක් කරන්න.

05. "**කෝට්ටේ යුගයේ** සිංහල පද්‍ය සාහිත්‍යය, විවිධත්වයෙන් මෙන් ම විචිත්‍රත්වයෙන් ද යුක්ත වූවකි." සසාධකව විමර්ශනය කරන්න.

06. ' භාෂාව ' යනු කුමක්දැයි විවිධ නිර්වචනානුසාරයෙන් පැහැදිලි කරන්න.

07. උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතියේ ක්‍රියාකාරීත්වය පහදමින් භාෂණ සිංහලයේ ශබ්ද භෝඩිය විභාග කර දක්වන්න.

08. ' උපභාෂා ' යන්න හඳුන්වා , සිංහල භාෂා සමාජයේ ව්‍යවහාර වන ප්‍රාදේශීය උපභාෂා ලක්‍ෂණ පරීක්ෂා කරන්න.

09. "භාෂාව හා සංස්කෘතිය අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධතාවකි." සාකච්ඡා කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් <u>දෙකකට</u> සටහන් ලියන්න.

i. සිංහල භාෂා ද්විරූපතාව (Sinhalese Diglossia)
ii. සිංහල භාෂාවේ ප්‍රාස්තාවික ස්වරූප (Registers)
iii. පරිමිත භාෂා (Restrictic Language)
iv. ජාතික භාෂාව (National Language) සහ රාජ්‍ය භාෂාව (Official Language)
v. සන්ධිවීම් හා සන්ධිකිරීම්

**(2-10 දක්වා පිළිතුරුවලට ලකුණු 19 බැගින්)**

**********************